## ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - 2018

---------------------------------------------------------------------

### 1.1 මතය

---------

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු.81,852,700 ක් වූ නියාමන ගාස්තු කොමිෂන් සභාව වෙත 2018 දෙසැම්බර් 31 දින වනවිටද ලැබී නොතිබුණි. තවද බලපත්‍රලාභීන්ගෙන් සියයට 28 කගෙන් 2018 වර්ෂය සඳහා ලැබිය යුතු නියාමන ගාස්තු නියමිත දිනට අයකරගෙන නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලයෙන් අය විය යුතුව පවත්නා වාර්ෂික නියාමන ගාස්තු හිග රු.81,852,700 ක මුදල් ලබා ගැනිම සඳහා කටයුතු කර ඇති බවත්, විදුලිබල හා පුනර්ජනනීය අමාත්‍යාංශයේ ලේකම් ද දැනුවත් කළ බවත් කාරුණිකව දන්වමි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා කඩිනමින් පියවර ගත යුතුවේ. |
| (ආ) | ලිහිසි තෙල් අලෙවිකරුවකු විසින් 2013 හා 2014 වර්ෂ සඳහා ගෙවිය යුතු රු.1,134,697 ක් සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2017 දෙවන අර්ධ වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු.5,000,000 ක් වූ ඇස්තමේන්තු කල විචල්‍ය ලියාපදිංචි ගාස්තු 2019 මාර්තු මාසය වන විටත් ලැබී නොතිබුණි. | ග්‍රීස් සහ ලිහිසි තෙල් අලෙවි කිරිම සඳහා බලපත්ලාභියෙකුගෙන් කොමිෂන් සභාවට අයවිය යුතු රු.1,134,697 ක මුදල එම ආයතනයේ මවු සමාගම විසින් භාණ්ඩාගාරය වෙත ගෙවා ඇති බව දන්වා ඇත. එය තහවුරු කරගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් විමසීමක් කර ඇති බවත්, පිළිතුරු ලැබුණු පසු සුදුසු පරිදි කටයුතු කරන බවත් කාරුණිකව දන්වමි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් අයවිය යුතු මුදල මෙතෙක් ලැබී නැති බවත් එය කඩිනමින් ගෙවන ලෙස දන්වා යවා ඇති බවත් කාරුණිකව දන්වමි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා කඩිනමින් පියවර ගත යුතුවේ. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත 3(1) හා 3(2) වගන්ති | කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් ඇති වී මාස 03 ක් ඇතුළත එම පුරප්පාඩුව පුරවනු ලැබිය යුතු වුවත්, එක් සාමාජික තනතුරක් 2014 සැප්තැම්බර් 30 දින සිට පුරප්පාඩුව පැවතුණි. | මෙම පුරප්පාඩුව පිරවීම කළ යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකගත්වය මත ජේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් වේ. එසේ පුරප්පාඩුව පවත්නා බවට අමාත්‍ය වරයා දැනුවත් කර ඇත. | පනතේ ප්‍රතිපාදන අනුව අදාල තනතුරු පිරවීමට කඩිනමින් පියවර ගතයුතුය. |
| (ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබූ අවස්ථා පහත පරිදි වේ.<br>(i) සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් නොකිරීම. | මෙම ආයතනය නියාමන කාර්යන්ට අදාලවූ කොමිෂන් සභාවක් බැවින් එකී කාර්යන්ට අදාලවන පරිදි කාර්ය සාධන ඇගයීම් ක්‍රමවේදයක් සකස් කර අනුගමනය කර ඇත. එබැවින් මෙම චක්‍රලේඛයේ දැක්වෙන ආකෘතිය පරිදිම වූ කාර්ය සාධන ගිවිසුම් අත්සන් කරවා ගැනීමක් සිදු කර නැතිබව කාරුණිකව දන්වමි. | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) නිශ්චිතව පැවරුණු වගකීම්වලට අදාලව පවතින නිපුණතා සහ රාජකාරි සාර්ථකත්වය සඳහා පැවතිය යුතු නිපුණතා අතර පරතරය හඳුනා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර නොතිබීම. | පිළිගත් ආයතන මගින් පවත්වනු ලබන පුහුණු සැසි සඳහා එම නිළධාරීන් සහභාගි කරවීම හා පුහුණුවෙන් අනතුරුව ඔවුන් වෙත අදාල පුහුණුවට යෝග්‍ය වූ කාර්යන් පැවරීම දැනටද සිදු කරමින් පවතී. | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iii) ආයතනයට සුවිශේෂී මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබීම. | ඉදිරි වසර සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරිමට කටයුතු කරන බවද දැනුම් දෙමි. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | | (iv) මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික විය යුතුය. 2018 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සාමාජිකයින් 45 කගෙන් සමන්විත වූ අතර, මුළු කාර්ය මණ්ඩලයෙන් 2018 වර්ෂය තුලදී පුහුණු අවස්ථා 14 දෙනෙකුට පමණක් එනම් සියයට 31 කට පමණක් සීමා වී තිබුණි. | මුදල් ප්‍රතිපාදන හා සේවයේ අවශ්‍යතා හා නිලධාරීන්ගේ ඉල්ලීම් සලකා බලා පුහුණු අවශ්‍යතා සපුරා ඇත. ඉදිරියේදී චක්‍රලේඛයේ ප්‍රකාරව කටයුතු කරමි. | - එම - |
| (ඇ) | 2003 ජුනි මස 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය | මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, කොමිෂන් සභාවේ 2017 වාර්ෂික වාර්තාව 2018 දෙසැම්බර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2018 මාර්තු 31 වැනි දින ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත භාරදී ඇති බවත්, 2018.12.03 දින භාෂාත්‍රයෙන්ම පිටපත් 10 බැගින් ඉදිරිපත් කර ඇති නමුත් පාර්ලිමේන්තුවේ සභාගත කිරිම සඳහා වන දැනුම් දීම සිදුකර නොමැති බව කාරුණිකව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.106,029,515 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.111,090,475 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,060,960 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී පසුගිය වර්ෂයට සාපේක්ෂව ආදායමේ වැඩිවීම රු.24,871,289 ක් හෙවත් සියයට 7.5 ක් වුවද පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම්වල වැඩිවීම රු.29,932,249 කින් හෙවත් සියයට 14 ක් වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

-------------------------------------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව වෙනත් ආදායම් රු.12,779,629 කින් වැඩි වී තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 128 ක් විය. පොලී ආදායමේ වැඩිවීම, වාහනයක් විකිණීමෙන් ලත් මුදල් හා ප්‍රදාන-(පුනරාවර්ථන) යන අයිතමයන් ආදායමෙහි වැඩිවීමට බලපා තිබුණි. එසේ වුවද 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී ලිපිද්‍රව්‍ය සඳහා වූ වියදම රු.738,778 කින් හෙවත් සියයට 101 කින්ද නීතිය හා ගවේශනාත්මක වියදම් රු.560,856 කින් හෙවත් සියයට 35 කින්ද වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාවේ කාර්යාලය ස්ථාන ගතකර ඇති ලංකා බැංකු මර්චන්ට් ටවර් ගොඩනැගිල්ලේ 6 වෙනි මහලේ කාර්යාල පරිශ්‍රයට අමතරව ඛනිජ තෙල් හා ජල කර්මාන්ත නියාමන කටයුතු සිදු කිරීමේ අරමුණෙන් 2017 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි 17 වන මහල ද කාර්යාල කටයුතු සඳහා කුලී පදනම මත ලබාගැනීමට කටයුතු කර තිබූ නමුත් අදාල කාර්යය 2019 අප්‍රේල් මාසය දක්වා ආරම්භ නොවීම නිසා 2017 හා 2018 වර්ෂවලදී රු. මිලියන 05 ක් නිෂ්කාර්ය ලෙස වැය කිරීමට සිදුවී තිබුණි. | ඛණිජ තෙල් හා ජල කර්මාන්තයේ නියාමන කටයුතු ඉටු කිරීමේ කාර්ය භාරයද මෙම කොමිෂන් සභාවට පැවරුණු බැවින් 6 මහලේ ඇති ඉඩකඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම නිසාත් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල තුලම ඉඩකඩ ලබාගැනීම සුදුසු නිසාත් 17 වන මහලෙන් කොටසක් පමණක් කුලියට ලබා ගන්නා ලදි. ඛණිජතෙල් හා ජල කර්මාන්තයට අදාල පනත් කෙටුම්පත් කර ඇතත් සම්මත කරගැනිමට මෙතෙක් නොහැකිවි ඇති බව පිළිගනිමි. 17 වැනි මහළ කාර්යාල කටයුතු සඳහා භාවිතයට ගනිමින් පවතී. | කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස වියදම් කළ යුතුවේ. |
| (ආ) | ලිහිසි තෙල් අලෙවි කරන්නන් අර්ධ වාර්ෂිකව සිය මුළු විකුණුම් ඉන්වොයිස් වටිනාකමෙන් කොමිෂන් සභාවට ගෙවිය යුතු මුදල නිවැරදි විකුණුම් අගයන් පදනම් කරගෙන ගෙවා ඇද්ද යන්න තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් කොමිෂන් සභාව ක්‍රියාත්මක කර නොතිබුණි. මීට පෙර විගණන විමසුම් මගින් මෙම තත්ත්වය පෙන්වා දී තිබූ නමුත් ආයතන 13 කින් ආයතන 2 ක් පමණක් 2018 වර්ෂය සඳහා විකුණුම් වාර්තා එවා තිබුණි. | ලිහිසිතෙල් අලෙවි කිරිමේ බලපත්‍රලාභීන් මෙම ගාස්තු ගණනය කිරිමේදී පදනම් කරගනු ලබනුයේ විකුණුම් වටිනාකම් වන අතර විකුණුම් වටිනාකම විගණක විසින් සහතික කරවා එවන ලෙසට දැනුම් දි ඇති බවත් කාරුණිකව දන්වමි. | අය කෙරෙන ගාස්තුවල නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි ලබාගත යුතුවේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයේ නියාමන කටයුතු සම්බන්ධ කොමිෂන් සභාවට බලතල පැවරී තිබූ නමුත් ලංකා විදුලිබල මණ්ඩලය කොමිෂන් සභාවේ ඇතැම් නිර්දේශ සහ නියමයන් අනුගමනය කිරීම මගහැර තිබූ අවස්ථා පැවති අතර කොමිෂන් සභාව විසින් එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අවස්ථා පහත පරිදි නිරීක්ෂණය කෙරේ. | විදුලිබල ක්ෂේත්‍රයේ නියාමන කටයුතු කරගෙන යාමේදී කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශ හා නියමයන්ට ලංකා විදුලිබල මණ්ඩලය අවනත නොවූ අවස්ථා සහ නියාමන උපදෙස් අනුගමනය නොකළ අවස්ථා පැවති බව පිළිගනිමි. | කොමිෂන් සභාව සතු බලතල ක්‍රියාත්මක කර නියාමන කටයුතු විධිමත් කිරීම කොමිෂන් සභාවේ වගකීමකි. |

| | | | |
|---|---|---|---|
| (i) | සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් කොමිෂන් සභාව වෙත මාස 06 කට වරක් ඇස්තමේන්තුගත තොග සැපයුම් මිළ ගණන් ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතු වුවත්, 2018 ජූනි මාසයෙන් පසුව විදුලිබල මණ්ඩලය විසින් එම මිල ගණන් කොමිෂන් සභාවට ඉදිරිපත් කර නොතිබීම. | ඇස්තමේන්තුගත තොග සැපයුම් මිළ ගණන් 2018 ජනවාරි සිට කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණු බැවින් මිළ ගනන් අනුමත කිරිමට නොහැකිවිය. | - එම - |
| (ii) | සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත් කරන සත්‍ය ආදායම් සහ පිරිවැය දත්ත උපයෝගී කර ගනිමින් කොමිෂන් සභාව කාර්තුමය වශයෙන් ඒකීය මිළ ගැලපීම (Uniform National Tariff Adjustment) සකස් කර සම්ප්‍රේෂණ බලපත්‍රලාභීයා වෙත සන්නිවේදනය කරනු ලබන අතර ලංකා විදුලිබල මණ්ඩලය 2018 ජනවාරි මාසයේ සිට අවශ්‍ය දත්ත කොමිෂන් සභාවට ඉදිරිපත් නොකිරීම. | 2018 ජනවාරි සිට 2019 මේ දක්වාම සත්‍ය ආදායම් සහ පිරිවැය තොරතුරු නොසැපයීම නිසා කාර්තුමය වශයෙන් මිළ ගැලපීම් කොමිෂන් සභාව විසින් අනුමත කර ප්‍රකාශයට පත් කළ නොහැකිවී ඇත. | - එම - |
| (iii) | සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් විදුලි ගාස්තු හැර, විදුලි සැපයුම සම්බන්ධ අනෙකුත් සේවා සඳහා ඉදිරි වර්ෂයේදී අයකරන ගාස්තු සහ ගණනය කිරිම් සෑම වර්ෂයකම නොවැම්බර් 15 දිනට පෙර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගතයුතු වුවද විදුලිබල මණ්ඩලය 2018 වර්ෂයේදී 2019 වර්ෂය සඳහා එපරිදි කටයුතු කර නොතිබීම. | එළඹෙන ඉදිරි වර්ෂයේ ගාස්තු අනුමත කිරිම සඳහා අදාල බලපත්‍ර ලාභීන් විසින් අය කිරිමට යෝජිත වූ ගාස්තු කොමිෂන් සභාව වෙත සපයා අනුමත කරවා ගතයුතු වුවත් එම විස්තර නොසැපයීම නිසා කොමිෂන් සභාවට එම බලපත්‍ර ලාභීන්ගේ ගාස්තු අනුමත කිරිමේ හැකියාවක් නොවූ බව දන්වමි. | - එම - |
| (iv) | කොමිෂන් සභාව විසින් ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පෞද්ගලික සමාගම (LECO) උදෙසා විදුලිය සම්බන්ධ කාර්යන්හිදී සිදුවන අනතුරු වාර්තා කිරීම සඳහා සිදුවීම් වාර්තාකරණ පරිගණකමය පද්ධතියක් හඳුන්වා දී ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලය 2018 මැයි මාසයෙන් පසුව මෙම පද්ධතියට දත්ත ඇතුළත් කර නොතිබීම. | විදුලිය සම්බන්ධ කාර්යන්හිදී සිදුවන අනතුරු වාර්තා කිරිම සඳහා හදුන්වා දි තිබු වාර්තා කරන පරිගණකම ය පද්ධතියට ලංකා විදුලිබල මණ්ඩලය විසින් තොරතුරු ඇතුලත් කිරිමෙන් වැලකී සිටිම නිසා එම අනතුරු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරිමට නොහැකිවූ අවස්ථා පැවති බව දන්වනු කැමැත්තෙමි. | - එම - |
| (v) | 2018 වර්ෂය තුළදී උපදේශන ආයතනයක සහාය ඇතිව රු.මිලියන 2.54 ක වියදමකින් යුත් පාරිභෝගිකයන්ට විදුලි සම්බන්ධතාවය ලබාදීමේ සහ විදුලි සැපයුමට අදාළ ගිවිසුම්, අයදුම්පත්‍ර සහ ඒ සම්බන්ධ මාර්ගෝපදේශ සකස් කර තිබුණි. අදහස් විමසීම් සඳහා අදියර කීපයකදී ලංකා විදුලිබල මණ්ඩලයට සාකච්ඡා සඳහා සහභාගි වන ලෙස | විදුලි පාරිභෝගිකයන්ගේ පහසුව සඳහා සහ රැකවරණය සඳහා යෝග්‍ය වූ මාර්ගෝපදේශ සැකසිමේ කාර්ය සඳහා එම බලපත්‍ර ලාභීන්ගේ ද අදහස් හා යෝජනා ඉදිරිපත් කිරිම වෙනුවෙන් අවකාශ සලසා දුන් නමුත් එම සාකච්ඡා සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සහභාගි විමෙන් වැලකි සිටීම නිසාවෙන් | - එම - |

| | |
|---|---|
| කොමිෂන් සභාව විසින් ආරාධනා කර තිබූ නමුත් එක් රැස්වීමක් සඳහා පමණක් සහභාගී වී තිබීම. | එයින් අපේක්ෂිත පරිදි සාකච්ඡා හා සම්මුති මගින් එකගවන පරිදි පාරිභෝගික සහන ලබාදීමේ හැකියාව වැලකී ඇති බවත් දන්වා සිටිනු කැමැත්තෙමි. |

**3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂ 05 තුළ එළඹි උපදේශන සේවා ගිවිසුම්වලට අදාළ කාර්යයන්ගේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් කොමිෂන් සභාව වෙත සැපයිය යුතු තොරතුරු නොසැපයීම හේතුවෙන් පහත දැක්වෙන ව්‍යාපෘතීන් හි ඵලදායිතාවය අවම මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | | |
| | (i) රුපියල් මිලියන 10.2 ක වියදමක් දරා ක්‍රියාත්මක කරන විදුලි සංප්‍රේෂණ හා බෙදාහැරීමේ පිරිවැය අවම කිරීමේ හැකියාවක් තිබූ විදුලි සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පිරිවැය අවම කිරීමේ ව්‍යාපෘතිය. | (i) බෙදාහැරීමේ පිරිවැයෙහි ප්‍රසස්ථ මට්ටම් නිර්ණය කිරීම. (BENCHMARKING TRANSMISSION & DISTRIBUTION COST.) මෙම ව්‍යාපෘතියෙන් විදුලි සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පිරිවැය අඩුකිරීමේ හැකියාවක් තිබුනද ලංකා විදුලිබල මණ්ඩලය අවශ්‍ය ඇස්තමේන්තු ගත දත්ත නොසැපයිම නිසා කාර්ය භාරය අපේක්ෂිත කාල පරිච්ඡෙදය තුළදී නිම කළ නොහැකි විය. | උපදේශන සේවාවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට අවශ්‍ය දත්ත සපයා ගැනීම සඳහා නිසි පියවර ගත යුතුවේ. |
| | (ii) අවම පිරිවැයක් යටතේ සම්ප්‍රේෂණ බලපත්‍ර ලාභියා විසින් උත්පාදන බලපත්‍රලාභියාගෙන් විදුලිය මිලදී ගැනීම සිදු කර තිබේද යන්න පිළිබඳ පරීක්ෂා කිරිම සඳහා වූ වටිනාකම රු.මිලියන 12 ක් සහිත Develop Dispatch Audit Guide Lines ව්‍යාපෘතිය. | **(ii) සැපයුම් විගණන මාර්ගෝපදේශය සකස් කිරීම (Develop Dispatch Audit Guide Lines)**. උපදේශක සමාගම විසින් විගණනය සඳහා අවශ්‍ය කරන වැඩසටහන්, ආකෘතිපත්‍ර සහ මාර්ගෝපදේශ සකස් කර දී ඇති නමුත් විදුලිබල මණ්ඩලය එම ආකෘතිපත්‍ර සම්පූර්ණ කර නොඑවීම නිසා කාර්යය ඉටුකළ නොහැකි විය. | - එම - |
| | (iii) අනාගත විදුලි මිල සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා ඉවහල් වන ගාස්තු සූත්‍රකරණ ව්‍යාපෘතිය. | **(iii) ගාස්තු සූත්‍රකරණ ව්‍යාපෘතිය (Tariff Formulation)** අනාගත විදුලි මිළ සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරිම සඳහා උපයෝගි | - එම - |

| | | | |
|---|---|---|---|
| | | කරගැනිමට අවශ්‍ය වූ දත්ත හා තොරතුරු විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලා යැවූ නමුත් එම තොරතුරු නොසැපයීම නිසා අපේක්ෂිත කාර්ය භාරය අතරමග නවතා දැමීමට සිදුවිය. | |
| (iv) | අර්ධ වාර්ෂිකව සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ ඇස්තමේන්තුගත තොග සැපයුම් මිල ගණන් අනුමත කිරීම සඳහා වූ Study on Generation Cost Benchmarking ව්‍යාපෘතිය. | **(iv) ජනන පිරිවැය ප්‍රසස්ථකරණය පිළිබඳ අධ්‍යයනය (Study on Generation Cost Benchmarking)** සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ ඇස්තමේන්තු ගත තොග සැපයුම් මිළ පරීක්ෂාකර අනුමත කරගැනීම සඳහා ඉවහල් කර ගත යුතුව තිබූ නමුත් ඊට අදාළ විස්තර ලංකා විදුලිබල මණ්ඩලය නොසැපයීම නිසා අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත නොහැකි විය. | - එම - |
| (v) | ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතියේ ස්ථාවරත්වය සම්බන්ධ අධ්‍යයනයක් (Network Stability Study) සිදු කල උපදේශක සමාගම විසින් සිය අවසන් වාර්තාවේ ශ්‍රී ලංකාව තුළ පවතින විදුලිබල පද්ධතියේ ස්ථාවරත්වය, පවතින දුර්වලතා සහ එම දුර්වලතා අවම කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර තිබූ අතර, විදුලිබල මණ්ඩලයෙන් තොරතුරු නොලැබීම මත එහි සාර්ථක අසාර්ථකභාවය තහවුරු කරගත නොහැකි විය. | (v) ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතියේ ස්ථාවරත්වය සම්බන්ධ අධ්‍යයනයක් සිදු කළ නමුත් (Network Stability Study) කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කළේද යන වග පසු විපරම් කිරීමට විදුලිබල මණ්ඩලය විසින් තොරතුරු එවා නොතිබුණි. | - එම - |

(ආ) බලපත්‍රලාභීන්ගේ ආරක්ෂාව අරමුණු කරගත් ආරක්ෂණ හා තාක්ෂණ කළමනාකරණ සැලසුමක් සකස් කිරීම සම්බන්ධ උපදේශන සේවා ලබා ගැනීම සඳහා කොමිෂන් සභාව විශ්ව විද්‍යාලයක් තෝරාගෙන 2018 අප්‍රේල් 16 දින වටිනාකම රු.මිලියන 7.75 ක් වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) 2007 වර්ෂයේ ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය මගින් නිකුත් කරන ලද උපදේශකවරුන් තෝරා ගැනීමේ හා සේවයේ යෙදවීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.5.1 සහ 9.5.2 ඡේද ප්‍රකාරව, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ උපදේශන ආයතනය සමඟ කොමිෂන් සභාව විධිමත් ගිවිසුමක් අත්සන් කළයුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරිමේ ලිපියේ භාණ්ඩ හා සේවා සැපයීමේ එකගතාවය මත ගිවිසුමක් ඇතිවන බැවින් වෙනම ගිවිසුමක් අත්සන් කර නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මෙම කාර්යයට අදාළ ආශ්‍රිත ක්‍රියාකාරකම් (Terms of Reference) හි ප්‍රසම්පාදන කාලසටහන අනුව ආරක්ෂණ හා තාක්ෂණික කළමනාකරණ සැලසුම මාස 5 ක කාලයක් තුළ නිමකළ යුතු වේ. එසේ වුවද, 2019 මාර්තු 15 දින දක්වා උපදේශන ආයතනය විසින් අදාල කාර්යය සම්පූර්ණ කර නොතිබුණි. | අවසාන වාර්තාව සැකසීම සඳහා වූ දත්ත සහ තොරතුරු ලබා ගැනීමට විදුලි බල මණ්ඩලයේ බලාගාර හා අනෙකුත් පරිශ්‍ර වලට පිවිසීමට අවකාශ නොදීම මත මෙය නිම කරගැනිමට නොහැකිවි ඇත. | ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 9.2(ඩී) හා (ඊ) ඡේද අනුව නව කාර්ය මණ්ඩලයෙහි සංවිධාන ව්‍යුහය සංශෝධනය කර එය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යොමු කර අනුමැතිය ලබාගත යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. | නියාමන ආයතනයක් වන මෙම කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය කොමිෂන් සභාවේ අනුමැතියට අනුව සකසාගෙන ඇති අතර 2002 අංක 35 දරන පනතේ (1)12ආ වගන්තිය පරිදි කටයුතු කර ඇති බවත් කාරුණිකව දන්වමි. | චක්‍රලේඛ ප්‍රතිපාදනවලට අනුගත විය යුතුය. |
| (ii) ඉහත (අ) හි සඳහන් චක්‍රලේඛයෙහි 9.3 ඡේදය අනුව බඳවා ගැනීම් හා උසස් කිරීම් සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් පැවතියයුතු අතර එම ක්‍රමවේදය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව අදාල අමාත්‍යාංශය වෙත යොමුකර අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 12 වැනි වගන්තියෙන් ලැබී ඇති බලතල මත කටයුතු කර ඇති බැවින් වෙනත් අනුමැතියක් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් පැන නැගී නොමැත. | චක්‍රලේඛ ප්‍රතිපාදනවලට අනුගත විය යුතුය. |

| | | |
|---|---|---|
| (iii) 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 51 ක් වූ අතර එදිනට තත්‍ය කාර්යය මණ්ඩලය 43 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 08 ක් විය. | අනුමත සේවක සංඛ්‍යාව 51 ක් බවත් තථ්‍ය සේවක සංඛ්‍යාව 43 ක් බවත් අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව නිළධාරීන් බඳවාගෙන නැති බවත් කාරුණිකව දන්වමි. | පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අංශ 08 ක ක්‍රියාකාරකම් 21 ක ප්‍රගතිය අවම මට්ටමක පැවති අතර එම තත්ත්වය කොමිෂන් සභාවේ සමස්ථ කාර්ය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය කෙරේ. | ඊට හේතු වූයේ එම ක්‍රියාකාරකම් ඉටුකිරිම සඳහා අවශ්‍ය වූ දත්ත, බලපත්‍රලාභීන් විසින් සපයා නොදීම හා ප්‍රසම්පාදන කාර්යන් සඳහා අවශ්‍ය වූ කමිටු පත් කරගැනිමේදී අමාත්‍යාංශ කාර්යභාරයන් වෙනස් වීම මත සිදුවුණු ප්‍රමාද වීම් නිසාවේ. | ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් ඉටු වන බවට කළමනාකරණය වගබලා ගත යුතුය. |